# සංක්‍රාන්තිය: පාසල වෙත සක්‍රීය ආරම්භයක්

## පවුල් සඳහා වන තොරතුරු පත්‍රිකාව

**ඔබ සහ ඔබගේ දරුවා මෙම වසරේ පාසල වෙත හුරුපුරුදු වන විට, පාසල් ගමන ආරම්භ කිරීමට දිගු ගමනක් ඇති බව පෙනේ. පාසල වෙත යන ගමන ආරම්භ කිරීම අභියෝගාත්මක මෙන්ම ප්‍රමෝදජනක විය හැකි අතර, මෙම තොරතුරු පත්‍රිකාව මගින් වසර ඉදිරියට යන අතරතුරු ඔබ සහ ඔබගේ දරුවාගේ පාසල වෙත සංක්‍රාන්තිවීමට ඔබගේ දරුවාගේ බාල ළමාවිය වැඩසටහන මගින් ඔබට උපකාර කරන ආකාරය සම්බන්ධ තොරතුරු ලබාදේ.**

ඔබගේ දරුවා දැනටමත් විවිධ කුඩා සහ විශාල පරිමාණයේ සංක්‍රාන්ති අත්දැකීම් ලබා ඇත. ඔබගේ දරුවා නව/අඩු හුරුපුරුදු පරිසරවලට ප්‍රතිචාර දක්වන ආකාරය මගින් (උදාහරණ වශයෙන්, ඔබ නිවාඩු ගියවිට, ළමා රැකවරණ හෝ පහළ බාලාංශය ආරම්භ කරන විට, ක්‍රීඩා දිනවලට යන විට)  එක ක්‍රියාකාරකමක සිට හෝ එකාකාරී ක්‍රියාවක සිට වෙනකකට සංක්‍රාන්ති වන විට වුවද ඔබගේ දරුවා නව තත්වයන්ට මුහුණ දෙන ආකාරය සහ ඔවුනට උපකාර කල හැකි හොඳම ආකාරය පිළිබඳ පිංතූරයක් ලබාදේ.

### පාසලට සක්‍රීය ආරම්භයක් ලබාදීම වැදගත්වන්නේ ඇයි?

පාසලට සක්‍රීය ආරම්භයක් ලබාදීම මගින් සංක්‍රාන්ති අවස්ථාවේදී සහ ඉන් ඔබ්බට ඔබගේ දරුවාට වඩා හොඳ ඉගෙනීමේ සහ සුභසාධන ප්‍රතිඵල ලබාදේ. ඒ මගින් ඔබගේ දරුවාට අවිච්ඡින්න ලෙස ඉගෙනීමට සහ සංවර්ධනයවීමට උපකාර ලබාදෙන අතර ඔවුන්ට ආරක්ෂාකාරීබව හැඟීමට, විශ්වාසය ඇතිවීමට, සහ අළුත් මිනිසුන් සහ ස්ථානවලට සම්බන්ධවීමට උපකාරවේ.

### ඔබගේ දරුවාව පාසලට ඇතුලත් කිරීම

බොහෝ ප්‍රාථමික පාසල් සිය පාසලට ඇතුලත් කරගැනීමේ ක්‍රියාවලි අරම්භ කරන්නේ දරුවන් පාසල ආරම්භ කරන වසරට පෙර වසරේ මැයි මාසයේදීය. ඔබ ඔබගේ දරුවා පාසලට ඇතුලත් කල විට, පාසල වෙත සංක්‍රාන්තිවීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මගින් පාසල දැන හඳුනා ගැනීමේ අවස්ථා වැඩිකර ගත හැකිය. වඩාත්ම කාර්යක්ෂම සංක්‍රාන්ති ආරම්භ වන්නේ වසර අවසානවීමට බොහෝ කලින් වන අතර එම වැඩසටහන් පාසලේ පළමු දින කිහිපයට වඩා ඔබ්බට යයි.

### පාසලට සංක්‍රාන්තිවීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

පාසල වෙත සංක්‍රාන්තිවීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වලට සහභාගිවීම මගින් ඔබේ දරුවාගේ පාසල කුමන ආකාරයේ එකක්ද යන්න වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට ඔබට සහ ඔබගේ දරුවාට උපකාර වන අතර පාසලට එන වෙනත් දරුවන් සහ ඔවුන්ගේ පවුල් සමඟ සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමටද අවස්ථාව උදාවේ.

---

### සංක්‍රාන්ති ඉගෙනීම සහ සංවර්ධන ප්‍රකාශනය

ඔබගේ දරුවාගේ බාල ළමාවිය ගුරුවරයා විසින් *Transition Learning and Development Statement* (සංක්‍රාන්ති ප්‍රකාශනය) ලියනු ඇත. මෙම ප්‍රකාශනය මගින් ඔබගේ දරුවා හට උනන්දුව ඇති දේ, කුසලතා සහ හැකියාවන් සාරාංශගත කරනු ඇත. එය මගින් තනි පුද්ගල ප්‍රවේශයන් සහ ඉගැන්වීමේ උපායන් හඳුනා ගන්නා අතර ඒ මගින් ඔබගේ දරුවාගේ පාසලට සහ මුල් පංති ගුරුවරුන් හට ඔබගේ දරුවා සම්බන්ධනේ කඩිනමින් දැනගැනීමට හැකිවන අතර උචිත ඉගෙනීමේ සහ ඉගැන්වීමේ වැඩසටහන් සැලසුම් කල හැකිය.

ඔබ ඔබගේ දරුවාව පාසල් වේලාවෙන් පිටත රැකවරණ (Outside School Hours Care (OSHC)) සේවාවකට යාමට සැලසුම් කරන්නේ නම්, සංක්‍රාන්ති ප්‍රකාශනය OSHC සේවාව වෙතද ලබාදිය හැකිය. සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් OSHC ශික්ෂකයන් හට ඔබ දරුවාට උනන්දුව ඇති දේ සඳහා සැලසුම් කල හැකි අතර බාල ළමාවිය, පාසල සහ OSHC අතර ඇති අවිච්ඡින්න සම්බන්ධතාවයට උපකාර කල හැකිය.

සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් ඔබගේ දරුවා පාසල වෙත සංක්‍රාන්තිවනවිට ඔබගේ දරුවාගේ ඉගෙනීම අවබෝධ කර ගැනීමට, එයට උපකාර කිරීමට, ඒ සම්බන්ධයෙන් කථා කිරීමට සහ එයට උනන්දු කිරීමට උපකාර කල හැකිය. ඔබගේ දරුවාගේ සම්පූර්ණකල සංක්‍රාන්ති ප්‍රකාශනයක පිටපතක් ඔබට ලබාදෙනු ඇත.

ඔබගේ දරුවාගේ සංක්‍රාන්ති ප්‍රකාශනයේ ඔබගේ දරුවාගේ නම, උපන් දිනය සහ ඡායාරූපය, සහ ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධවීමේ තොරතුරු ඇතුලත් සමහර පුද්ගලික තොරතුරු ඇතුලත්ව ඇත. අවශ්‍ය අවස්ථාවල එහි ඔබගේ දරුවාට උපකාර කරන වෙනත් බාල ළමාවිය වෘත්තීකයන්ගේ නම්ද ඇතුලත්ව ඇත.

සංක්‍රාන්ති ප්‍රකාශනය සාමාන්‍යයෙන් ලියන්නේ 4වන වාරයේදීය. නමුත් ඔබගේ දරුවාට ආබාධිතබවක් හෝ වර්ධනයවීමේ ප්‍රමාදයක් ඇතිනම්, ඔබ සහ ඔබගේ දරුවාගේ පාසල සමඟ අවශ්‍ය ඇතුලත් කල හැකි උපකාර සම්බන්ධ සංවාදය ඇරඹීමක් වශයෙන් ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් ජූනි/ජූලි මාසවල සංක්‍රාන්ති ප්‍රකාශනයක් කලින් ලියනු ඇත.

ඔබ ඔබගේ දරුවා සම්බන්ධ බොහෝ දේ දන්නා බැවින්, ප්‍රකාශනය වෙත ඔබගේ දායකත්වය ඉතා වැදගත්වේ. සංක්‍රාන්ති ප්‍රකාශනයේ කොටසක් සම්පූර්ණ කිරීමට ඔබට ආරාධනා කරනු ඇත. සංක්‍රාන්ති ප්‍රකාශනයේ කොටසක් ඔබ විසින් සම්පූර්ණ කිරීම මගින් ඔබට සහ ඔබගේ දරුවාට පාසල මගින් උපකාර කල හැකි ආකාරය සම්බන්ධයෙන් පාසල දැනගන්නා අතර ඒ මගින් ඔබ දෙදෙනාටම පාසල වෙත ඉතා හොඳ ආරම්භයක් ලබාගත හැකිය.

ඔබගේ දරුවා විසින් සම්පූර්ණ කලයුතු කොටසක්ද ඇත (වැඩිහිටියෙකුගේ උපකාර ඇතිව, මෙම වැඩිහිටියා ඔබ හෝ ඔබගේ දරුවාගේ බාල ළමාවිය ගුරුවරයා විය හැකිය). මෙම කොටසේ සාමාන්‍යයෙන් චිත්‍රයක් සහ ඔබගේ දරුවා පාසලේ කුමක් සම්බන්ධයෙන් කුතුහලයෙන් සිටීද සහ පාසල ආරම්භ කිරීම සම්බන්ධයෙන් ඔවුන් සිතන දේ ඇතුලත්වේ.

---

### ඔබගේ දරුවා සම්බන්ධ තොරතුරු ඔබගේ දරුවාගේ පාසල සමඟ හුවමාරු කරගන්නා ආකාරය

2018 පටන්, සංක්‍රාන්ති ප්‍රකාශනය සම්පූර්ණකර, එම තොරතුරු බෙදාහදා ගැනීම සඳහා *Insight Assessment Platform* (ඇගයීමේ මෙවලම්/උපකරණ ඇතුලත් මාර්ගගත වේදිකාවක්) යන මාර්ගගත මෙවලමේ තැන්පත් කර තබයි. *Insight Assessment Platform* හි තැන්පත් කර ඇති සියළුම තොරතුරු ඕස්ට්‍රේලියාව තුල ආරක්ෂාකාරීව තැන්පත් කර තැබේ.

සියළුම වික්ටෝරියනු රජයේ පාසල්වල *Insight Assessment Platform* භාවිතා කරන අතර ඒ මගින් ඔබේ දරුවාගේ ඉගෙනීම සහ සංවර්ධනය සම්බන්ධ දිගින් දිගට පවතින වාර්තාවක් තබා ගැනීමට පාසල්වලට ඉඩකඩ ලබාදේ. සමහර කතෝලික සහ

ස්වාධීන පාසල් වෙතද ඔබගේ දරුවාගේ සංක්‍රාන්ති ප්‍රකාශනය *Insight Assessment Platform* ඔස්සේ හෝ ඔබගේ දරුවාගේ බාල ළමාවිය සේවාව වෙතින් මුද්‍රිත පිටපතක් හෝ ඉලෙක්ට්‍රොනික පිටපතක් ලබාදෙනු ඇත.

අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව (දෙපාර්තමේන්තුව) මගින් එහි සමහර කාර්යයන් බාහිර සේවා සපයන්නන් වෙත ගිවිසුම් මගින් ලබාදෙනු ඇත. මෙය සිදුවන අවස්ථාවල ගිවිසුම් මගින් ලබාදීමේ කාර්යාවලියේ කොටසක් වශයෙන් දෙපාර්තමේන්තුව මගින් දත්ත ආරක්ෂාකර ගැනීමේ ක්‍රියාමාර්ගයන් ගැනීම අවශ්‍යවේ. දෙපාර්තමේන්තුව මගින් දෙපාර්තමේන්තුවේ තොරතුරු පුද්ගලිකතා ප්‍රතිපත්තිය සහ අදාල පුද්ගලිකතා නීතිවලට www.education.vic.gov.au/Pages/privacypolicy අනුව කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා *Insight Assessment Platform* සම්බන්ධ පුද්ගලිකතා නීතිවලට බලපාන ආකාරය සම්බන්ධ ඇගයීමක් සිදුකර ඇත.

සංක්‍රාන්ති ප්‍රකාශනවල ඇති තොරතුරු සහ සමහර පාසල්වල දරුවන් ඇතුලත්කර ගැනීමේ දත්ත දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කිරීමේ සහ පර්යේෂණ කටයුතු වෙනුවෙන් භාවිතා කල හැකිය. මෙම තොරතුරු සංඛ්‍යාත්මක ආකාරයට (උදා. අංක සහ ප්‍රස්ථාර ලෙස) ඉදිරිපත් කරන අතර තනි දරුවන්ව නම් **නොකරනු ඇත**.

*Insight Assessment Platform* සම්බන්ධ වැඩිදුර විස්තර, සඳහා අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව සමඟ psts@edumail.vic.gov.au යන ඊමේල් ලිපිනය ඔස්සේ සම්බන්ධ වන්න.

## වැඩිදුර විස්තර සඳහා

කරුණාකර www.education.vic.gov.au/transitiontoschool යන වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

මෙම ලියවිල්ල භාෂා ගණනාවකට පරිවර්තනය කර ඇති අතර www.education.vic.gov.au/transitiontoschool යන වෙබ්අඩවිය වෙත ප්‍රවේශවීමෙන් ලබාගත හැකිය.